# කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව
# முகாமைத்துவக் கணக்காய்வுத் திணைக்களம்
# DEPARTMENT OF MANAGEMENT AUDIT

මුදල් අමාත්‍යාංශය | நிதி அமைச்சு | MINISTRY OF FINANCE
මහලේකම් කාර්යාලය, කොළඹ 01 | செயலகம், கொழும்பு 01 | The Secretariat, Colombo 01


මගේ අංකය / எனது இல / My No: DMA/AMC/02/2021/02
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2021.12.24

කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක DMA/01 - 2019 (1)

අමාත්‍යාංශ ලේකම්වරුන්,
රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
දිස්ත්‍රික් ලේකම්වරුන්,

**<u>අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශ</u>**

කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් 2019.01.12 දිනැතිව නිකුත් කරන ලද කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක DMA/01-2019 චක්‍රලේඛයේ 06 වන ඡේදය සහ එහි ඇමුණුම 03 මෙයින් අවලංගු කරනු ලබන අතර, ඒ වෙනුවට මෙම චක්‍රලේඛය සහ මෙහි ඇමුණුම් 3(1) හා 3(11) අදාල කර ගත යුතුය.

02. 2022 වර්ෂයේ සිට ඉදිරියට වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම "අවදානම් පාදක අභ්‍යන්තර විගණන සැලැස්මක්" ලෙස සකස් කල යුතුය. ඒ සඳහා අවශ්‍ය වන මඟපෙන්වීම් මාගේ අංක DMA/AMC/02/2021/02 හා 2021.04.05 දිනැති කළමනාකරණ විගණන චක්‍රලේඛ ලිපි අංක DMA/01-2019/1 මගින් සියලුම අභ්‍යන්තර විගණකවරුන් වෙත ලබා දී ඇත.

03. ඒ අනුව සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 දිනට පෙර ඉදිරි වර්ෂය සඳහා වන තම අභ්‍යන්තර විගණන සැලැස්ම අවදානම් පාදක අභ්‍යන්තර විගණන සැලැස්මක් ලෙස සකස් කර එහි පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත හා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. තව ද, එම අභ්‍යන්තර විගණන සැලැස්ම විගණන හා කළමනාකරණ කමිටුවේ දී අනුමත කර ගත යුතුය. අමාත්‍යාංශ යටතේ ඇති අනෙකුත් සියලුම ආයතන විසින් සකස් කරනු ලබන අභ්‍යන්තර විගණන සැලැස්මේ පිටපතක් අදාල අමාත්‍යාංශය වෙත ද ඉදිරිපත් කළ යුතුය.

04. තම ආයතනය තුල පවතින අවදානම් සහිත ක්ෂේත්‍රයන්, ක්‍රියාකාරකම් හා උප ක්‍රියාකාරකම් හඳුනා ගෙන ඒවා අවදානම් ලේඛනයට ගෙන අවදානම තක්සේරු කර ඒවායෙහි පවතින ඉහළ අවදානම් සහිත ක්‍රියාකාරකම් අභ්‍යන්තර විගණන සැලැස්මට ඇතුලත් කර ගත යුතුය. එම ඉහළ අවදානම් සහිත ක්‍රියාකාරකම් විගණනය කිරීම තුළින් ඒවායෙහි පවතින අවදානම් තත්ත්වයන් අවම කර ගැනීම හා අවදානම ඉවත් කර ගැනීම සඳහා අවශ්‍ය සුදුසු පිළියම් හා ක්‍රියාමාර්ග ගැනීම තුළින් ආයතනයේ කාර්යසාධනය ඉහළ නංවා ගැනීමට හැකි වනු ඇත.

එස්.ඒ. චන්ද්‍රිකා කුලතිලක
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත - විගණකාධිපති


කාර්යාලය / அலுவலகம் / Office: 2484816, 2484500, 2484600, 2484700
අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் நாயகம் / Director General: 2484543
ෆැක්ස් / பெக்ஸ் / Fax: 2449496
වෙබ් අඩවිය / வெப் சைட் / website: www.treasury.gov.lk

# අවදානම් ලේඛනය 20xx
## (විගණන සැලැස්ම සකස් කිරීමට පදනම් කර ගැනීම සඳහා)
## විගණන ආස්ථිතයයේ නම

| (1) අනු අංකය | (2) ආයතනයේ අරමුණු ඉටු කර ගැනීම සඳහා වන වගකීම් ක්ෂේත්‍රය | (3) එක් එක් වගකීම් ක්ෂේත්‍රය යටතේ වන ක්‍රියාකාරකම් | (4) ආයතනයේ අදාල අංශය | (5) අවදානම් විස්තරය / බලපෑමේ ස්වභාවය | (6) අවදානමක් සිදුවීමේ සම්භාවිතාව 1-5 | (7) අවදානමේ බලපෑම 1-5 | (8) අවදානම් ප්‍රමාණය තක්සේරුව (6)*(7) | (9) ප්‍රමුඛතාවය / යොමුව /අවදානම හඳුනා ගැනීමේ අංකය |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | | | | | | | | |
| 2 | | | | | | | | |
| 3 | | | | | | | | |

ඇමුණුම 3(11)

# අභ්‍යන්තර විගණන සැලැස්ම - 20xx

...........................................................................

අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/දිස්ත්‍රික් ලේකම් කාර්යාලය/ආයතනය

1. ආයතනයේ මෙහෙවර :

2. ආයතනයේ අරමුණු :

| (01)<br>අනු අංකය | (02)<br>අවදානම්<br>ඇගැයීම මත අභ්‍යන්තර විගණනය විසින් හඳුනාගන්නා ලද විගණනය සඳහා වන ක්‍රියාකාරකම් | (03)<br>අවදානම් තක්සේරුව (යොමු අංකය) | (4)<br>අභ්‍යන්තර විගණන කාර්යය ඉටුකරනු ලබන කාලසීමාව | | | | (5)<br>ඉදිරිපත් කිරීමට අපේක්ෂිත විගණන වාර්තා ගණන (දර්ශකය) | (6)<br>අභ්‍යන්තර විගණනය සඳහා යෙදවිය හැකි මිනිස් ශ්‍රමය (දින) |
|---|---|---|---|---|---|---|---|---|
| | | | 1<br>කාර්තුව | 2<br>කාර්තුව | 3<br>කාර්තුව | 4<br>කාර්තුව | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |